වලපනේ ප්‍රාදේශීය සභාව - 2023

--------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වලපනේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.2 ඡේදයේ (ආ),(ඇ),(ඈ), (ඉ), (ඊ),(එ),(ඕ), (ජ) සහ (ට) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.58,150 ක කාබනික පොහොර තොගයක්ද, අවස්ථා 07 කදී ගෙවන ලද රු.147,361 ක විවිධ වියදම් හා රු. 94,300 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය තැන්පත් ශේෂය රු. 122,415 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් ශේෂ 02 ක ශේෂයන් උපලේඛනයේ දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේ දී රු. 1,936,538 ක නොසැසඳීම් විය. | 2024 මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.2,347,317 ක ගිණුම් ශේෂ 05 කට අදාළ ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොවූයෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | නිවැරදි ඇප ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර අනෙකුත තොරතුරු ඉදිරිපත් කරන බව | ගිණුම් ශේෂ සනාථ කිරීමට අදාළ ලේඛන හා ලිපිගොනු පවත්වා ගත යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| | 1946 අගෝස්තු 07 දිනැති අංක 30 දරන වරිපනම් හා තක්සේරු පනතේ 20 වන වගන්තිය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 5 කට වරක්වත් සිදුකළ යුතු වුවද, ප්‍රාදේශීය සභාව 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | දේපළ තක්සේරුව අලුත් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි හා අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති බව | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාගල උප කාර්යාලයේ නිළධාරීන් පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත කර නොතිබුණි. යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස සිට භාවිතය ආරම්භ කොට මාස 1½ ක් ඇතුළත සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 18 දින අදාළ යන්ත්‍රයට අලාභ හානිකොට එය ක්‍රියාවිරහිත කොට තිබුණි. | වටිනාකම අයකර ගැනීමේ පදනම මත මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,403,905 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,153,885 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,027,000 | 5,401,063 | 5,658,278 | 3,008,958 | 2,877,000 | 4,768,063 | 5,327,808 | 3,266,172 |
| (ii) | කඩ කුලී | 10,885,500 | 4,320,795 | 3,757,022 | 8,673,602 | 11,518,000 | 16,184,257 | 2,855,586 | 8,109,829 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,974,000 | 3,898,359 | 3,898,359 | | 4,456,000 | 2,959,854 | 2,959,854 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,500,000 | 3,055,990 | 9,370,627 | 3,135,499 | 91,103,000 | 14,309,041 | 19,149,245 | 9,450,127 |
| | | 26,386,500 | 16,676,207 | 22,684,286 | 14,818,059 | 109,954,000 | 38,221,215 | 30,292,493 | 20,826,128 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
---------------------------------------
සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩ කාමර කුලී වලින් බිල්කළ ආදායමින් රු.1,556,904 ක් හෙවත් සියයට 62 ක්ද, වරිපනම් බදු රු.1,442,615 ක් හෙවත් සියයට 57ක් ද හිඟ හිටව පැවතුණි. | කඩකාමර වල අයිතිය නිරවුල් වී නොමැති බැවින් කුලී අයකිරීම ප්‍රමාද වී ඇති බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුලී<br>------ | | |
| | සභාවට අයත් කඩ කාමර 45 කින් වසර 05 කට අධික කාලයක සිට එකතුව රු.7,084,698 ක කඩකුලී අයකර නොතිබුණි. | කඩ කාමර තුළින් හිඟ අයකර ගැනීමට නොහැකිව ඇත්තේ භූමියේ අයිතිය සම්බන්ධව ගැටලුවක් පවතින බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ඇ) | වෙනත් ආදායම්<br>-------------------- | | |
| i. | 1947 අංක 43 දරන විනෝද බදු ආඥා පනත අනුව රාගල උප කාර්යාල බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන සිනමාහලකින් විනෝද බදු අයකර නොතිබුණි. | ඉදිරි කටයුතු සඳහා කාර්යභාර නිලධාරී හා ආදායම් පරීක්ෂක ලිඛිතව දැනුම්වත් කර ඇති බව | ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 03 ත් 05 ත් අතර කාලයක සිට අයකර ගත යුතු සතිපොළ බදු, කුලී, රථවාහන නැවතුම් ගාස්තු හා වැසිකිළි බදු කුලී එකතුව රු.926,917 ක් අයකර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරන බව | ආදායම් අයකර ගැනීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| iii. | සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ අනුමත සංචාරක හෝටල්, ලැඟුම්හල්, ආපනශාලා 06 කින් ආදායමින් සියයට එකක් වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | අයකර ගැනිමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

| | | | |
|---|---|---|---|
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,092,299ක් හා මුද්දර ගාස්තු රු. 2,043,200 ක් විය. | මුද්දර ගාස්තු අයවෙමින් පවතින බව. | ආදායම් ගෙන්වා ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.
---------------------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ සභා ආදායම් වැඩිකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් සභාව විසින් නව ආදායම් මාර්ග හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 79 සිට 84 දක්වා වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළ ජලාප්‍රවාහන සම්බන්ධ කිසිදු සංවර්ධන කටයුත්තක් ඉටු කර නොතිබුණි. | වියදම් පාලනය මත සංවර්ධන කටයුතු නවතා තිබුණු අතර , මෙම වසරේ සංවර්ධන කටයුතු සිදුකරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්ති වල කටයුතු ඉටුකිරීම සඳහා ප්‍රදේශයේ මල ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ගලි රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ප්‍රාදේශීය සභාව වෙත ගලි රථයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපි යොමුකර ඇති බව | පනතේ වගන්ති ප්‍රකාරව මහජන සේවා ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ III කොටස අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටද මංමාවත් ඉදිකිරීම ,වැඩිදියුණු කිරීම සඳහා සභා අරමුදලින් කිසිදු මුදලක් යොදවා නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනය මත සංවර්ධන කටයුතු නවතා තිබුණු අතර ,මෙම වසරේ සංවර්ධන කටයුතු සිදුකරන බව | පනතේ වගන්ති ප්‍රකාරව මහජන සේවා ඉටුකළ යුතුය. |
| (ඉ) | සභාව විසින් පවත්වාගෙන යන ජලයෝජනා ක්‍රම 02 ක ජලය පිරිපහදු කර පානීය ජලය සැපයීමට කටයුතු කර නොතිබුණි. | මෙම ජල ව්‍යාපෘති නඩත්තු කිරීමේ අපහසුතාවක් ඇති බැවින් ප්‍රජා ජල ඒකකය වෙත පවරා දීමට කටයුතු කරමින් පවතින බව | මහජනයාට පිරිසිදු පානීය ජලය ලබාදිය යුතුය. |
| (ඊ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරන ලද 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර 24 ක පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගැසට් පත්‍රය මඟින් සභාවට පවරා ඇති නියාමන කටයුතු සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ මාර්තු හා අප්‍රේල් මාස වලට අදාලව රු. 419,062 ක වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාළ වැටුප් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.238,201 ක පොදු තැන්පතු ශේෂ 07 ක් නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව අවස්ථා 21 කදී පාර්ශවයන් විසින් විවිධ කරුණු සඳහා සහා අරමුදලට බැර කර තිබුණු රු.242,999 ක් වසර 20 සිට වසර 36 දක්වා කාල පරාසයක සිට නිරවුල් කර නොතිබුණි. | සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සතු වාහන 03 ක මයිලෝ මීටර දීර්ඝ කාලයක සිට අක්‍රිය වී පැවතියද අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාවිතා කළ ඉන්ධන ලීටර් 208.45 ක් සඳහා වැය කළ රු.68,872 ක නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බවත් .මයිලෝ මීටර් මේ වන විට අලුත්වැඩියා කර ඇති බව. | මයිලෝ මීටර් අළුත්වැඩියා කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට බැංකු ජංගම ගිණුම් 03 ක ශේෂය රු. 13,742,314 ක් පැවති පුනරාවර්ථන ලැබීම් වලින් කිසිදු මුදලක් ප්‍රාදේශීය සංවර්ධනයට යොදා ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | මෙම වසරේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන බව කාරුණිකව දන්වන අතර ,ඉකුත් වර්ෂයේ වියදම් පාලනය මත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ බව | සහා ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදාගත යුතුය. |

3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.2,546,375 ක ස්ථාවර වත්කම් 09 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි ස්ථාවර වත්කම් 15 ක් වසර 04 සිට 13 දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | සුදුසු පරිදි අලුත්වැඩියා කිරීමට/බැහැර කිරීමට/වෙන්දේසි කිරීමට කටයුතු කරන බව | වත්කම් උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වාහන 10 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුම්වත් කර අදාළ පවරා ගැනීම් නිසි පරිදි සිදුකිරීමට කටයුතු කරන බව | පවරා ගැනීම් නිසි පරිදි සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කඩ කාමර 04 ක්, මන්ත්‍රීතැන්න කසළ අංගනය, පදියපැලැල්ල උප කාර්යාලය සහ පුස්තකාලය, මැදහින්නවල ප්‍රජා ශාලාව අළුත්වැඩියාවකින් තොරව අබලන් වී පැවතුණි. | නාය යෑම් අවධානම් භූමියක් වීම තුළ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට නොහැකිව පවතින බව | සභා දේපලවල ආරක්ෂා තහවුරු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් සුසාන භූමි තුනක හා ඉඩමක වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | සභා අරමුදල සතුව ප්‍රමාණවත් තරම් මුදල් නොතිබීම තුළ මෙම කටයුතු සිදු කිරීමේ ප්‍රමාදයක් ඇති බව. | සභා දේපලවල ආරක්ෂා තහවුරු කළ යුතුය. |

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාගල සුසාන භූමි ඉඩම සුසාන භූමියක් ලෙස භාවිතා කර නොතිබුණු අතර අක්කර 01 ක පමණ භූමි ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස් දැනුවත් කර සුදුසු පියවර ගැනීමට කටයුතු කරන බව | සභා දේපලවල ආරක්ෂා තහවුරු කළ යුතුය. |

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ඔක්තෝබර් සිට 2021 දෙසැම්බර් දක්වා කාලය තුල සිදු කර තිබුණු වැටුප් අක්‍රමිකතාව හා අදාල පාර්ශවයන්ගෙන් අයකර ගන්නා ලද රු. 3,660,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වැටුප් අක්‍රමිකතාව සම්බන්ධයෙන් අයකර ගන්නා ලද මුදල ස්ථාවර තැන්පත් ලෙස වෙන් කර බැංකු ගත කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිය ගිය හා සේවය අත්හිටවූ නිලධාරීන් 25 දෙනෙකුගේ රු.638,082 ක ණය ශේෂ මාස 04 සිට වසර 07 ක කාල පරාසයක සිට අයකර නොතිබුණි. | අය කිරීමට කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුය. |